

## තාත්තේ ....

නිරංජලා රාජපක්ෂ

රාස්සිගේ අව්ව මැදින්
ගොම්මන් කළුවර එනකොට
පුංචි හිතට බිය දැනුනලූ
සෙවනැලි වලටත් පණවිත් ....
අක්ක එක්ක අත්වැල් බැඳ
දෑස් යොමා බලා උන්නෙ
දවසේ මෙහෙවර නිමකොට
තාත්තා ආපහු එනතුරු ....
අපේ පුංචි ලෝකේ එදා
උන්නු එකම මහා විරුවා
ඔබම තමයි හැමදාමත්
මා ආදර තාත්තේ ....
පඩි දවසට දෝත පුරා
රස මසවලූ පුරවාගෙන
එනතුරු අතැගිලි ගනිමින්
උන්නෙ අපයි තාත්තේ ....
කවදාවත් නැත වෙනසක්
නියතයක්ම විය සැකෙවින්
අඳුර මැදින් සතුට අරන්
ඔබ ආවා තාත්තේ ....
එහෙත් අහෝ පුරා වසක්
ගෙවෙයි හෙටට ඔබ නික්මී
මරු සමගින් දුරු ගමනක්
ඇයිද ගියේ තාත්තේ ....
පුංචි කාලේ වගේ අදත්
සිත තවමත් මග බලනව
ඔබ කොයි මොහොතේ ඒදැයි
මා ආදර තාත්තේ ....
එහෙත් අනේ කවදාවත්
ඔබ ආපසු නොඑනා බව
හඬාවැටෙන  නෙතට කෙලෙස
පවසන්නද තාත්තේ  ....

## ඇඳුරු වත

අතුල විජේවික්‍රම

ගුත්තිල ඇඳුරන් තවමත්
දෙපා වාරු නැති වුනාට
තක්සලාව දෙස හෙම්හිට
සක්මනේ යෙදෙයි

මූසිල ගොඩවී රටකට
සිල්ලරට අලෙවිකර නැණ
තත් ගැලවුණු වීණාවෙන්
රාගයක් සොයයි

දේවදත්ත හොර රහසෙම
පොවලා රා නාලාගිරිට
ගිජ්ජකූටෙ උඩට වෙලා
නෙත් යොමා සිටියි

මක්කලි ගෝසාල නඩය
ආලවක යකුන් බැහැදැක
වන්දනා මාන කරමින්
සාදයක් තබයි

## කල්පාන්තරය

ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර

කල්පාන්තර වේදනාවකි.
හිස්ව යන නිමේෂය
අවසාන මධුවිත
පොකැට්ටුවේ කැරැට්ටුව මැනවින් හැඳිනුව.

මොහොතකට තිගැස්සී හැරී බලමි
ඉකිගසන විට හිස් වීදුරුව
හිස්ව යනු දැක මා
මොහොතින් මොහොත.

නැගිටින්නට පෙර
අවසන් වරටත් එබී බලමි
විසිරුණු ලුනු බිකි අතර
එකම එක කඩල ඇටයක් ඇහිඳින්නට.
සෝදිසි මෙහෙයුමෙන් මා පරාදය..
සටන් කරන්නට එකම එක මුනිස්සමක් හෝ නැත
පොකැට්ටුව සිසාරා බැලූවද.

ඉඳින් මම නැගිටිමි.
වැටි වැටී නැගිටිමි.
ආයෙත් නම් එපා
හිතුවක්කාර පියාපත්
ඉගිළෙන්න හරි බයයි දැන් මම.
පායන්නත් එපා
ත්‍රස්තවාදී නුඹේ ඇස්
හිස් වීදුරුවට ඉහළින්
විදුලි පංකාවට පහලින්
කොහේ හෝ සැගවී ඇත්දැයි හොයන්නට
ආදරයේ නොව..?

ජීවිතයේ අංශු මාත්‍රයක්..!

boondi.lk

## මේධා

මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

ගිරංග මත මුදු රැයට
සඳ නො විඳි සඳ එළිය
ආ දා...
රත් දෙතොල් මධු බඳුන
තණ බිමෙහි තවරන්න
මේධා....

විෂ විතෙන් සච්දිය පිරුව
කිසිදාක ඉලක්කය නො වැරදුණ
සර්ප පරපුර මැද...
රෙහෙණු මිස පෙති
නො පළඳන්නට නියම ලද
සදාකාලික මල ඔබ.

කඳු ශිඛර මං පෙත් හි
කවට බස් ඇසිලූවෙද
නො වැළපෙන බව දිවුට
ඇසට දුක් ඇවිලූණි ද

දැන් ඉතිං ඔබ එන්න...

මුවරද ම උපදවා,
වෙහෙස වූ තොල් අගට
විෂ දළක් තබා ගිය
පරව ගිය වෙරළු මල්
නිය අගින් සිඳලන්න

සඳ දියෙන් කැළුම් දෙන
සෙවල කොරපොතු සමග
තාරකා යට හෙමින්
වැතිරෙන්න
නිශ්චල ම අහස සේ
පැතිරෙන්න

පළාපෙත්තන් පවා
ළය පුරා පෙම් වඩන
ස්නේහ තණ පත් අතර
සැගවෙන්න
විෂ මිදුණු හැව අතැර
ජීවිතේ විළිලන්න

වේදනා ගැබතුරෙහි
ප්‍රේමය ම ධාතු කොට
සැදුණු හද මිණක් ඇත
තබා ඇසි පියන් තුළ
සදා සුරැකිය යුතු

කඳු අතර,
ළඳැරියක ගී රාව
යළිත් නිම්නාද දිය යුතු.

කඳු අතර,
ඒ නදින්
හද මිණක සනහස
යළි ගලා යා යුතු...

ගිරංග මත මුදු රැයට
සඳ නො විඳි සඳ එළිය
ආ දා...
රත් දෙතොල් මධු බඳුන
තණ බිමෙහි තවරන්න
මේධා....

*මේධා - උපේක්ෂා නුවන්ශ්‍රී ගේ සර්පයාගේ දියණිය නවකථාවෙහි ප්‍රධාන චරිතය*

boondi.lk

## පහන් වැට

## මගේ ශෝකය

මොනිකා රුවන් පතිරණ

මගෙ කවි පදරුත් විමසා
නෙක ගුණ පවසන විට ඔබ
පැතූ ඉසුරු නොමලද සේ
මා හද කම්පා වන්නෙය

ලෝ වැසි හැමගෙන් සැ[illegible]වුණු
ඔබේ සොඳුරු මුදු සෙනෙහස
මා හද ගැබ සුරැකෙන බව
සබඳිනි ඔබ නොදන්නෙහිය

හෙළනා දිගු සුසුමෙන් මිස
බැහැර නොයන මගෙ සෙනෙහස
කවියක් සේ බිහිවන බව
සබඳිනි ඔබ නොදන්නෙහිය

ලියැවුණ කවි පද දහසක්
විමසා බැලූ මුත් මෙතුවක්
ඔබ මිස එහි අන් අරුතක්
නැති වග ඔබ නොදන්නෙහිය

*(තහනම් දේශයකින් - 1972)*

## පිණි බිඳුව



හිරු කුමරුනි
පමා වෙන්න
මේ පිණි මත
මට  තෙමෙන්න
උනු කඳුලක
දුක නිවන්න
පිණි බිඳුවක
සිසිල දෙන්න

හේමමාලි
බණ්ඩාරනායක